Page 15 April 2013.qxd 28/05/2013 15:47 Page 1



## ලංකා මාතා

සත් මහ සමුදුරෙන් වටවූ මව් ලංකා
රන් කෙත්යාය සරු පින්බිම මව්ලංකා
රන් මාණික්‍යයෙන් සරුබිම මව් ලංකා
පරිසර දේදුන්න වසනා මව් ලංකා

ඉන්දිය සාගරේ මුතු ඇට නම රැන්දූ
වීර සිංහලේ පණ දුන් ලක් පුත්තූ
ආදි කාලයේ දම් සුව රැව් දුන්නූ
ජාති ආලයේ නම් ගම් රන් පැළඳූ

සිව් ගම් සහෝදර ප්‍රේමය වැඩිවේවා!
සාමය සව් දනන් හද තුළ පැතිරේවා!
සව් සිත්සතන් දම් සුවඳින් වැගිරේවා!
මගෙ ලක්මව්නි ඔබ සැමදා වැජඹේවා!

♦ **සඳමාලි සිල්වා**
ශු පවුලේ කන්‍යාරාමය
කළුතර Sri Lanka

## හිරු පායා

කඳු මුදුනින් මිහිදුම් සළු පාවී යන්නේ
සූරියරැස් මල්කුමරියො හිනස්ස වන්නේ
මිහිරි නදින් සියොතුන් ගී නද පතුරන්නේ
පාන්දරින් හිරු මුළු ලොව එළිය කරන්නේ

රන්වන් පැහැ වී කරලින් කෙත බබලන්නේ
මාල ගිරා රංචු පිටින් පියඹා යන්නේ
සුදු ඇඳුමෙන් පුංචි ළමෝ පාසැල් යන්නේ
උදෑසනේ අසිරිය මුළු ලොවට කියන්නේ


ඕලු නෙළුම් මානෙල් මල් වැවේ දිලෙන්නේ
සුළඟ වැදී වැව් දියරැළි ඉවුරෙ හැපෙන්නේ
පුංචි පුංචි මාලු පැටව් පිහිනා යන්නේ
උදෑසනේ සිරියාවයි මෙයින් කියන්නේ

♦ **ජයමිණි රත්නායක**
*ස්වර්ණමාලි බාලිකා විදුහල,*
*මහනුවර* Srilanka

## මගේ දින චරියාව

උදෑසනින් පිබිදෙමී
හොඳින් අකුරු උගනිමී
ගුරුන්ට අවනත වෙමී
හොඳ පුරවැසියෙකු වෙමී

♦ **කසුන් විරසිංහ**
මලියදේව විදුහල
කුරුණෑගල Sri Lanka




## The Pencil ලියන පැන්සල

The first pencils were sticks of Crumbia graphite used by 16th -century farmers to mark their sheep. The Germans later made pencils from powdered graphite held together with string. The Italian thought of the wooden casing still in use today. New Yorker Joseph Rachendorfer invented the rubber-tipped pencil in 1858.

**මු**ල්ම පැන්සල් පාවිච්කිරීමක් ගැන සඳහන් වන්නේ 16 වන සියවසේදී එංගලන්තයේ කම්බ්‍රියා පෙදෙසේය. එහි සතුන් ඇතිකළ ගොවියෝ එම කම්බ්‍රියා පෙදෙසේ බහුලව තිබූ මිනිරන් කැබලි ගෙන බැටලුවන්ගේ සමේ ඇතිල්ලීමෙන් උන් හඳුනාගැන්මට සලකුණක් තැබූහ. ඊට පසු ජර්මනුවරු මිනිරන් කුඩුකර ඒවා එකට සිටින සේ නූලකට කවා එය යමක් ලියන්නට යොදාගත්හ. අද භාවිතා වන ලී පැන්සලය සාදන ලද්දේ ඉතාලි ජාතිකයෙකි. ඇමරිකාවේ නිව්යෝර්ක් නගරයේ ජෝසප් රොවෙන්ඩෝෆර් නමැත්තා 1858 දී පිටුපස කෙළවර මකන රබර් කෑල්ලක් සහිත පැන්සලක් තැනීය.

♦ ***Auntie Ramani* (රමණී නැන්දා)**

**ප්‍ර**හුගිය අවුරුදු 16 ඇතුළත මේ ළමා පිටුවෙන් පුංචි ඔබ වෙනුවෙන් කැපවී ලෝකය ගැන විවිධ විස්තර මා සඳහන් කළා ඔබේ දැනගැනීම සඳහා. ඔබ ලියා එවූ කවි ගීත මා මෙහි පළකළා ඔබට අනාගතයේදී දක්ෂතා පෙන්වන්න මට කරන්න පුළුවන් උපකාරය එය නිසා. ඔබ එවූ ඔබේ නිර්මාණ සියල්ල මම කියෙව්වේ ඉතා සතුටෙන්. ළමයින් හැටියට මේ ළමා පිටියට කවි ලියූ ශ්‍රී ලංකාව ඇතුළු බොහෝ රටවල ජීවත්වන ලාංකික බොහෝ දෙනා අද වැඩිහිටියෝ වශයෙන් සමාජයේ වැදගත් තැන් හොබවනවා. ඒක මට විශාල සතුටක්. මේ මට ඔබ අමතන්නට ලැබෙන අවසාන අවස්ථාව. අනාගතයේදී ඔබ සැම ලොවට වැඩදායක බුද්ධිමත් මිනිසුන් වන බව මට විශ්වාසයි. ඔබට ආයුබෝවන්!

♦ **Auntie Ramani (*රමණී නැන්දා*)**


# ලංකා බැංකුව
# BANK OF CEYLON (UK) LTD

**එක්සත් රාජධානියේ අපගේ සියළු ගණුදෙනුකාර භවතුන්ට අළුත් අවුරුදු සුබපැතුම් !**

- ✔ ඉතිරිකිරීමේ ගිණුම්, ජංගම ගිණුම්, ස්ථාවර තැන්පතු
- ✔ පුද්ගලික ව්‍යාපාරික ණය
- ✔ ශ්‍රීලංකාවට මුදල් යැවීම
- ✔ ආනයන හා අපනයන සේවාවන්
- ✔ විදේශ මුදල් (යුරෝ හා ඇමරිකානු ඩොලර්) හුවමාරුව

අප හරහා ශ්‍රීලංකාවට මුදල් යවන ඔබට සෑම මසකටම වරක් පවුම් 50 බැගින් වූ සුපර්මාර්කට් වවුචර් 3 ක් දිනාගැනීමේ අවස්ථාව....!
මුදල් යවන වාර ගණන වැඩිවන විට දිණුම් අවස්ථා ද වැඩිවේ.
එක්සත් රාජධානියේ ස්වාධීන බැංකුවක් වන අපගේ තැන්පතුකරුවෝ මූල්‍යසේවා වන්දි යෝජනා ක්‍රමය (Financial Services Compensation Scheme) යටතේ £ 85,000 ක් දක්වා තැන්පතු ආරක්ෂණයකට සුදුසුකම් ලබති.

BANK OF CEYLON (UK) LTD
Gateway to Sri Lanka

1 Devonshire Square, London EC2M 4WD,
Tel: 020 7377 1888 Fax: 020 7377 5430
Email : info@bankofceylon.co.uk | Web : www.bankofceylon.co.uk
Nearest Tube: Liverpool Street

(Bank of Ceylon(UK)Ltd is 100% owned by Bank of Ceylon, Sri Lanka)
Bank of Ceylon (UK) Limited is authorised and regulated by the Financial Services Authority
(FSA Referance No: 514744)
Registered in England and Wales(Company Registration No:06736473).
Registered address and Head Office: 1 Devonshire Square,London EC2M 4WD






# යෞවනය දොරකඩ හිඳී



රත්න ශ්‍රී

## මා කැමති ඔබ කැමති ✻ ගීයක්



විශාරද අමරදේව



**සුවඳ මුවරද බරිනි ආකුල**
**යෞවනය දොරකඩ හිඳී**
**මලක් වී ඔබ පිපෙනු නිසැකයි**
**වසන්තය ළඟ ළඟම ඒ.**

**දරුවනේ වනමලක් යනු**
**එක රැයක අසිරිය නම් නොවේ**
**ගහත් පොළවත් වින්ද දුක් ගිනි**
**මලට හිමි ගුණ බිහිකරයි.**

**රොන් සලා පිනිබරව හිනැහෙන**
**කුසුම සතු යුතුකම මෙයයි**
**උපන්බිම මහ පොළව දූවිලි**
**නිබඳ සිහිපත් කළ යුතුයි.**

***තනුව සංගීතය හා ගායනය –***
**විශාරද පණ්ඩිත් අමරදේව**
***පද රචන – රත්න ශ්‍රී විජේසිංහ***

**වි**ශාරද අමරදේවයන් ගයන මේ සොඳුරු ගීය කීදෙනෙකු අසා ඇත්දැයි මම නොදනිමි. ලංකාවේ සිංහල ශ්‍රාවකයින් ගැන සලකන කල්හි ද මේ ගීය අසා ඇති අය ඉතා අල්ප විය හැකි ය. ඇසුව ද, ගීයේ පද හා අන්තර්ගතය ගැන ඔවුන් තුළ මතකයක් ඇද්දැයි මම නොදනිමි. එසේම එක්සත් රාජධානිය තුළ සිටින සියළු ලාංකික ගී රසිකයින් අතරින් මෙය අසා ඇත්තේ මා පමණකැයි යන්න බොහෝ විට නිවැරදි බව මට අනුමාන කළහැකි ය. ඒ මේ ගීය ගැන දන්නා වෙනත් කෙනෙක් මෙහි තවම මට හමු නොවූ බැවිනි.

දැනට වසර 20 කට පමණ පෙර ලංකාවෙන් මගේ මිතුරෙකු පටිගත කර ලන්ඩනයට එවා තිබූ VHS විඩියෝ පටයක පිළිවෙලකට අනුව නොව කලබලයෙන් අමුණන ලද සංගීතමය වැඩසටහන් කීපයක් විය. ඒ අතර මේ ගායනාව ද තිබුණි. කිසියම් රූපවාහිනී කැමරාවකට එතැන වූ සංගීත භාණ්ඩ කීපය උපයෝගී කරගනිමින් විශාරද අමරදේවයන් මේ **සුවඳ මුවරද ගීතය** ගායනා කොට එය ඒ සතියේ ගුවන්විදුලි සංස්ථාවේ මධුවන්ති වැඩසටහනට තමා එක්කළ අළුත් ගීතය බව ද පැවසුවා මට මතකය.

එම ගීතය රචනාකරන ලද්දේ ප්‍රවීන ගීපද රචකයෙකු හා කිව්වරයෙකු වන රත්න ශ්‍රී විජේසිංහයන් විසිනි. විශාරද අමරදේවයන්ගේ සුගායනීය බවද, ගීපදවල මට සිළිටිබවද, ඒ පිළිබඳව සිතන හැමවරකම ඉන් මතුවන ධවනිතාර්ථයන්ද නිසා එය මා එවක් පටන් තදින් ප්‍රියකරන ගීයක් බවට පත්වුනා පමණක් නොව එහි වචනද ක්ෂණිකව මා සිත්හි සටහන් විය. රත්නශ්‍රී ලියා ඇති ඔහුගේ සියළු ගී අතුරින් **සුවඳ මුවරද** මා වඩාත් ප්‍රියකරන ගීතයයි.

මෙය යොවුන් වියට එළඹෙන ළමා පරම්පරාව සිත්හි දරා ලියූ ගීතයකැයි මට සිතේ. මිනිස් ජීවිතය බොහෝ විට සමානකර ඇත්තේ පරිසරයේ වැඩෙන වෘක්ෂලතා වන්ටය. ඒ ගස් කොලන් සේම ජීවිතද විපර්යාසවලට භාජනය වෙති. උපදිති වැඩෙති නැසී යති. මේ සියල්ල ස්වභාව ධර්මයේ නිර්මාණයෝ වෙති. සොබා දහම මේ හැම දේකටම කාල පරිච්ඡේදයක් නිර්මාණය කරයි. සියල්ල සිදුවන්නේ ඒ තුළය. එහෙත් ඒවා කෙසේ සිදුවන්නේ දැයි කල්පනාකර බැලීමක් කා තුළවත් නැත. ගස් කොලන් වලට ඒ හැඟීම තිබෙන්නට හැකියයි නිකමට හැඟුනත් මිනිසුන්ගේ පැත් තෙන් ගෙන බලතහොත් තමා නිර්මාණය වූයේ කෙසේදැයි ජීවිතයේ අවසානය වනතුරුම කිසිම කෙනෙකු සිතන බවක් නම් නොපෙනේ. රත්න ශ්‍රී ලියූ මේ ගීය තුළින් අමරදේවයන් ඉතා සංවේදීව ලොවට දෙන අගනා පණිවුඩය එයයි.

ලොව දක්නට ඇති සියළු ආශ්චර්යයන්සේම යොවුන් වියද ජීවිතයට එන්නේ එක්වරක් පමණි. එය අපට රිසි අයුරින් හැමදාම තබාගත නොහැකිය. කැමරා කාචයේ එය සටහන්කර තැබුවත් එය ඇතිවී නැතිවී යන දෙයක් බව අවබෝධ වන විට ඉතිරිව ඇත්තේ ඒ යෞවනයේ අංශු මාත්‍රයක් පමණකැයි දැනේ. ඒ නටබුන් බොහෝ විට කළකිරීම ද වේදනාව ද සටහන් කරයි. ජීවිතයේ අනිත්‍ය යථාර්ථයත් එයම නොවේද?

එහෙත් ජීවිතයට වරක් පමණක් එන ඒ යොවුන්විය මනා සේ සැළසුම් කරගනිමින් තම ජීවිත යෙන් ලොවට කිසියම් අර්ථයක් ඉටුකර ප්‍රයෝජනවත් යමක් තබා යෑම සෑම ගසක වැලකම කාර්‍යය වෙයි. වෘක්ෂලතා එසේ නම් මිනිස් වර්ගයා ද එම ආදර්ශය පිළිපැදිය යුතුය. ඔවුන්ගෙන ද මිනිස් සමාජයට ඒ කාර්‍යය ඉටුවිය යුතුය.

මෙම පණිවුඩය මනාව ඔතා බහා ඇති මෙම ගීතය අමරදේවයන්ගේ වර්තමාන ගීතාවලියට ගීය පටිගතකළ දා සිටම ඇතුළත් වූයේ නම් කොපමණ හොඳදැයි මට සිතුණු වාර අනන්තය. එසේ වී නම් මෙය අද අප රටේ ජනප්‍රියම ගීත අතරින් එකක් වනවා නිසැකය. ගුවන්විදුලියෙන් පමණක් ගැයුණු ඉතා විශිෂ්ඨ ගී කැසට් හා සංයුක්ත තැටි ලෙස රසිකයින් අතරට නො ඒම කණගාටුවකි.

මේ නොබෝදා මා දුරකථන යෙන් ගාල්ලේ සිටින රත්න ශ්‍රී අමතා **සුවඳ මුවරද** ගීතය ගැන ඇසුවෙමි. එය එකල මධුවන්ති වැඩසටහනට පමණක් සීමාවූ බවත්, එම ගීය අමරදේවයන්ගේ අනෙක් ජනප්‍රිය ගී මෙන් ජනතාව අතරට නොඒම ගැන තමා ද දුක්වන බවත් රත්නශ්‍රී මට කීය.

ගීත ගැන කතාකරන මෙම විශේෂාංගය ඇරඹූ දා සිට අපේ පාඨකයින්ගෙන් ලංකා විත්තියට ලැබුණු ගී අගැයුම් බොහෝ ය. ඒවා සියල්ලම අපි මෙහි පළ කළෙමු. අද මේ අවසාන පත්‍රයට මා අමරදේවයන්ගේ ඒ අගනා ගීය ගැන ලිවිය යුතුයයි මට සිතිණ. ඔබට සුබ පතමින් මම නවතිමි.

♦ ***දයා ආනන්ද***


***Srilanka Information Sites ශ්‍රී ලංකා තොරතුරු අඩවි***
www.srilankans.com www.srilankatours.co.uk www.srilanka-holidays.co.uk